සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | පුරවැසි අධ්‍යාපනය I පත්‍රය<br>குடியுரிமைக் கல்வி மற்றும் சமூக நிர்வாகம் வினாத்தாள்-I<br>Citizenship Education Paper I | පැය එකයි<br>ஒரு மணித்தியாலம்<br>One Hour |
|---|---|---|

නම :- ........................................................ විභාග අංකය :- ........................................

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට ප්‍රශ්න පත්‍රය තුළ ම පිළිතුරු ලියන්න.
ii. දී ඇති උපදෙස් අනුව ම පිළිතුරු ලිවිය යුතුයි.

---

- ප්‍රශ්න අංක 1 සිට 10 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

1. ප්‍රජාතන්ත්‍රවාදය පාලන ක්‍රමය පිළිබඳව විමසා බලන විට එහි ප්‍රධාන ස්වරූප දෙකක් දක්නට ලැබේ. එය දැක්වෙන පිළිතුර වන්නේ
   I. වක්‍ර හා නියෝජිත ප්‍රජාතන්ත්‍රවාද ය.
   II. සෘජු හා වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය.
   III. සෘජු හා ඒක පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදය.
   IV. වක්‍ර හා බහු පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදය.
   (..........)

2. තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණයක් වන්නේ,
   I. ජනමත නියෝජනයට ඇති ඉඩකඩ සීමා කිරීම.
   II. අත්තනෝමතික පාලනයක් බිහි කිරීමට උත්සහ දැරීම.
   III. බහුවිධතාව තුළින් එක්සත් බව ගොඩනැගීම.
   IV. ආණ්ඩු පක්ෂය නිතර ම විවේචනය කිරීම.
   (..........)

3. "බාහිර බාධකයන්ගෙන් තොර ව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්තාව නිදහසයි," යනුවෙන් ප්‍රකාශ කරනු ලැබුවේ
   I. සීලර් ය.
   II. ජේ. ආර්. ලොවෙල් ය.
   III. ජී. ඩී. එච්. කෝල් ය.
   IV. ඒබ්‍රහම් ලින්කන් ය.
   (..........)

4. රටක නීතියේ ආධිපත්‍යය පවතින බවට හොඳ නිදසුනකි,
   I. සෑමෝම නීතියට ගරු කිරීම, අවනතවීම හා නීතිය අභිභවා යාම.
   II. අලුතින් නීති රීති සකස් කර වරදකරුවන්ට දඬුවම් පැමිණ වීම.
   III. චෝදනා පත්‍රයක් නොමැති ව අවශ්‍ය වූ විට පුද්ගලයන් අත් අඩංගුවට ගැනීම.
   IV. නීතියේ රැකවරණය සියල්ලන්ට ම සර්ව සාධාරණ ව ලැබීම.
   (..........)

5. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක බලය යනු එම රාජ්‍යයේ පාලන කටයුතු පවත්වා ගෙන යාම සඳහා එයට ඇති හැකියාවයි. එහි අවසාන හිමිකරුවා වන්නේ ජනතාවයි. එම බලය හැඳින්වෙන්නේ,
   I. අධිකාරී බලය.
   II. ස්වාධිපති බලය.
   III. ස්වාධීනතා බලය.
   IV. පරමාධිපත්‍ය බලය.
   (..........)

6. බලය විමධ්‍යගත කිරීම යනු
   I. මධ්‍යම ආණ්ඩුව සතු පරිපාලන බලතල යම් ප්‍රමාණයක් ප්‍රාදේශීය පාලන ඒකකවලට පවරා දීම.
   II. මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායක බලතලවලින් කොටසක් පළාත්වලට පැවරීම.
   III. මධ්‍යම ආණ්ඩුවේ විධායක බලතලවලින් කොටසක් ප්‍රාදේශීය සභාවලට පැවරීම.
   IV. මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල රාශියක් දිස්ත්‍රික්කවලට පැවරීම.
   (..........)

7. ශ්‍රී ලංකාව වැනි ඒකීය ආණ්ඩුක්‍රම පවතින රටවල පොදු ලක්ෂණයක් වන්නේ,
I. නීති පැනවීම සම්බන්ධයෙන් උත්තරීතර වන්නේ අධිකරණයයි.
II. රාජ්‍යයේ ස්වාධිපති බලය එක් බල මධ්‍යස්ථානයක් (මධ්‍යම ආණ්ඩුව) වෙත ඒකරාශී වී පැවතීම.
III. පරිපාලන පහසුව සඳහා මධ්‍යම ආණ්ඩුව බලය බෙදා හරියි.
IV. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලය පළාත් මට්ටමින් බෙදා හැර ඇත.

(..........)

8. ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවනු ලැබුයේ,
I. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ රාජාඥාවක් මගින්.
II. 1972 ජනරජ ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගිනි.
III. 1978 ආණ්ඩු ක්‍රමයේ 18 වන ව්‍යවස්ථා සංශෝධනය මගිනි.
IV. 1978 ආණ්ඩු ක්‍රමයේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය හා 1987 අංක 42 දරන පාර්ලිමේන්තු පනත මගිනි.

(..........)

9. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ලැයිස්තු කීයක් පදනම් කරගෙන බලතල වර්ගීකරණය කර ඇද්ද ?

I. 4ක් II. 3ක් III. 6ක් IV. 5ක්

(..........)

10. බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණයක් වන්නේ
I. විවිධ සංස්කෘතීන්ට ආවේනික සිරිත්විරිත්, ආචාර ධර්ම පද්ධතියක් නොපැවතීම.
II. විවිධ ජනවර්ග, විවිධ ආගමික විශ්වාස දරන, විවිධ භාෂා කතා කරන පුද්ගලයින් එකට ජීවත්වීම.
III. එක ජන කොටසක වුවද, ප්‍රාදේශීයව විවිධත්වයක් දැකිය නොහැකි වීම.
IV. ගෝලීයකරණය නිසා සංස්කෘතික සම්මිශ්‍රණය වේගයෙන් සිදු නොවීම.

(..........)

- **ප්‍රශ්න අංක 11 සිට 20 තෙක් ප්‍රශ්නවල <u>නොගැළපෙන</u> ප්‍රකාශයේ අංකය වරහන තුළ ලියන්න.**

11. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධකයක් නොවන්නේ,
I. භූගෝලීය පිහිටීම.
II. විජය ඇතුළු පිරිස පැමිණීම.
III. කාලිංග මාඝ ආක්‍රමණය.
IV. විවිධ ජාතීන් වෙළඳාම සඳහා නොපැමිණීම.

(..........)

12. යහපාලනය බිඳ වැටීමට හේතු වී ඇත්තේ
I. රාජ්‍ය පාලකයින් වගකීමෙන් යුතු ව කටයුතු කිරීම.
II. අනවශ්‍ය ආකාරයෙන් බලය මධ්‍යගත වීම.
III. රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම.
IV. අල්ලස හා දූෂණය ඉහළ යාම.

(..........)

13. බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංගයකි,
I. අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම.
II. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.
III. අන්‍ය මත ඉවසීම හා ඒවාට ගරු නොකිරීම.
IV. සමානාත්මතාව ය.

(..........)

14. මූලික ආර්ථික ප්‍රශ්න වන්නේ,
I. කවුද නිෂ්පාදනය කරන්නේ ?
II. කුමක්, කොපමණ නිෂ්පාදනය කරන්නේ ද ?
III. කෙසේ නිෂ්පාදනය කරන්නේ ද ?
IV. යොදා ගන්නා ශිල්ප ක්‍රමය කුමක් ද ?

(..........)

15. ධනවාදී අර්ථ ක්‍රමයක ලක්ෂණ නම්
I. තරගකාරී වෙළෙඳපොළක් පැවතීම.
II. ලාභය අරමුණු කර ගෙන නිෂ්පාදනය සිදුවීම.
III. ආදායම් සමාන ලෙස බෙදී යාම.
IV. නිෂ්පාදන සාධකවල අයිතිය පෞද්ගලික අංශය සතු වීම.

(..........)

16. ලෝකයේ පවතින අර්ථ ක්‍රම නම්,
I. ධනවාදී අර්ථ ක්‍රමය.
II. ඒකාධිපති අර්ථ ක්‍රමය.
III. මිශ්‍ර අර්ථ ක්‍රමය.
IV. සමාජවාදී අර්ථ ක්‍රමය.

(..........)

17. මනසේ සාමය ඇති කර ගැනීම සඳහා යොමු විය හැකි අංශ,
   I. ආගමික වතාවත් කෙරෙහි යොමු වීම.
   II. මනෝවිද්‍යාත්මක අභ්‍යාස නොපිළිගැනීම.
   III. උපදේශනය මගින්.
   IV. ස්වාභාවික පරිසරය නිරීක්ෂණය මගින්.

(..........)

18. ගැටුම්වලට හේතු
   I. අවහිරතා ඇති නොවීම.
   II. සීමා ඇති වීම.
   III. වෙනත් අදහස්
   IV. මානසික තත්ත්ව

(..........)

19. සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණ,
   I. සාකච්ඡාවෙන් විසඳුම් කරා යොමු වීම.
   II. ක්ෂණික විසඳුම් ලැබීම.
   III. වියදම් අවම ක්‍රමයක් වීම.
   IV. විධිමත් ව්‍යුහයකින් යුක්ත වීම.

(..........)

20. බේරුම්කරුවකු සතු ගුණාංග,
   I. හොඳින් සවන් දීම.
   II. මධ්‍යස්ථ නොවීම.
   III. නිවැරදි තීරණ ගැනීම.
   IV. සාධාරණභාවය.

(..........)

- **අංක 21 සිට 30 දක්වා ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ හතරෙන් තුනක් <u>නිවැරදි වේ</u>. නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

21. නීතියේ මූලාශ්‍ර
   A - විවිධ අණ පනත්.
   B - සිරිත්විරිත්.
   C - විධායකයේ තීරණ.
   D - ආගම.

   I. ABC   II. ABD   III. ACD   IV. BCD

22. රෝම ලන්දේසි නීතියට අමතර වෙනත් විශේෂ නීති වර්ග කිහිපයක් ද ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ. ඒවා නම්,
   A - ව්‍යවස්ථාදායක නීතිය.
   B - උඩරට නීතිය.
   C - මුස්ලිම් නීතිය.
   D - තේසවලාමේ නීතිය.

   I. ABC   II. ABD   III. ACD   IV. BCD

23. ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලය වන්නේ,
   A - මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ පෙත්සම් විභාග කිරීමේ බලය.
   B - පළාත් සභාව තුළ රීට් ආඥා නිකුත් කිරීම.
   C - රීති සැකසීමේ අධිකරණ බලය.
   D - උපදේශාත්මක අධිකරණ බලය.

   I. ABC   II. ABD   III. ACD   IV. BCD

24. අග්‍ර විනිශ්චයකාරතුමා රීති සම්පාදනය කරන ක්ෂේත්‍ර කිහිපයක් පහත දැක්වේ. ඒවා නිවැරදි ව දැක්වෙන ප්‍රකාශ කාණ්ඩය වන්නේ,
   A - ඇප දීම, නඩු කටයුතු පවත්වා ගෙන යාම.
   B - ජූරි සභා සම්බන්ධ කටයුතු.
   C – අධිකරණ සම්බන්ධ රීති සංශෝධනය.
   D - නීතිඥ වෘත්තිය හා සම්බන්ධ කටයුතු.

   I. ABC   II. ABD   III. ACD   IV. BCD

National e-learning Portal for The General Education

25. නීතියේ ආධිපත්‍යය තහවුරු වී ඇති සමාජයක දකිය හැකි ලක්ෂණ වන්නේ,

A - ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම.

B - නීතිය පිළිබඳ ව සෑම පුරවැසියෙකුට ම අවබෝධයක් තිබීම.

C - නීතිය නොදන සිටීම නිදහසට කාරණයක් ලෙස සැලකීම.

D - නීතිය ඉදිරියේ සෑම දෙනා ම සමාන පුද්ගලයන් සේ සැලකීම.

I. ABC II. ABD III. ACD IV. BCD

26. 1833 කෝල්බෲක් ආණ්ඩු ක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ වන්නේ,

A - ව්‍යවස්ථාදායක සභාව 15 දෙනෙකුගෙන් යුක්ත විය.

B - එය නිලලත් හා නිලනොලත් වශයෙන් බෙදා තිබුණි.

C - නිලලත් 06ක් ද නිල නොලත් 09ක් ද විය.

D – යුරෝපිය 03ක්, සිංහල 01ක්, දෙමළ 01ක්, බර්ගර් 01ක් ආදී වශයෙන් නිල නොලත් පිරිස බෙදා තිබුණි.

I. ABC II. ABD III. ACD IV. BCD

27. 1948 පෙබරවාරි 04 නිදහස ලැබීම නිසා,

A - කැබිනට් ආණ්ඩු ක්‍රමයක් ලැබුණි.

B - ඒක මාණ්ඩලික පාර්ලිමේන්තුවක් හිමි විය.

C - අග්‍රාණ්ඩුකාර ධූරයක් ඇතිවිය.

D - ද්වි මාණ්ඩලික පාර්ලිමේන්තුවක් හිමි විය.

I. ABC II. ABD III. ACD IV. BCD

28. 1978 ශ්‍රී ලංකා දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

A - විධායක බලය සහිත ජනාධිපති ධූරයක් ඇති කිරීම.

B - විධායක ජනාධිපති ප්‍රමුඛ අගමැති හා අමාත්‍ය මණ්ඩලයක් හඳුන්වා දීම.

C - පාර්ලිමේන්තු කටයුතු කොමසාරිස් ධූරයක් ඇති කිරීම (ඔම්බුඩ්ස්මන්).

D - සරල බහුතර නියෝජන ක්‍රමය හඳුන්වා දීම.

I. ABC II. ABD III. ACD IV. BCD

29. ව්‍යවස්ථාදායකයේ (පාර්ලිමේන්තුවේ) බලතල හා කාර්යයන් වන්නේ,

A - නීති සම්පාදනය කිරීම.

B - විධායකය පාලනය නොකිරීම.

C - අයවැය හා මූල්‍ය පාලනය.

D - නීති සම්මත කිරීම.

I. ABC II. ABD III. ACD IV. BCD

30. ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාමට සහය වීම සඳහා පුරවැසියාගෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් දක්වෙන්නේ,

A - පොදු පහසුකම් උපරිමයෙන් භාවිතය හා ඒවා ආරක්ෂා කිරීම.

B - ඵලදායී ජීවන වෘත්තියක නියැලීම.

C - නිදහස, සාධාරණත්වය සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

D - අල්ලස, දූෂණය, නාස්තිය, වංචාව පිටු දැකීම.

I. ABC II. ABD III. ACD IV. BCD

- **අංක 31 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ හතරෙන් තුනක් <u>වැරදි සහගත වේ.</u> වැරදි සහගත ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

31. පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවලට ප්‍රයෝජන නොවන කාණ්ඩය වන්නේ,

A – මහජන සේවාවන් පහසුවෙන් ලබා ගත නොහැකි වීම.

B - ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ඵලදායී ලෙස ඉටු කර ගැනීමට නොහැකි වීම.

C - සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සංවිධානාත්මක ව පවත්වා ගෙන යාම.

D - ළදරු පාසල්, මාතෘ සායන, ආයුර්වේද බෙහෙත් ශාලා මගින් ජනතාවගේ අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් වර්ධනය නොකිරීම.

I. ABC  II. ABD  III. ACD  IV. BCD

32. මානව හිමිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථා,

A - ක්‍රි.ව. 1216 - බ්‍රිතාන්‍යයේ මැග්නා කාර්ටා ගිවිසුම.

B - ක්‍රි.ව. 1688 - බ්‍රිතාන්‍ය අයිතිවාසිකම් පිළිබඳ පනත.

C - ක්‍රි.ව. 1790 - මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනය.

D - ක්‍රි.ව. 1917 - රුසියන් විප්ලවය.

I. ABC  II. ABD  III. ACD  IV. BCD

33. කාන්තා අයිතිවාසිකම් වන්නේ,

A - කාන්තාවන්ට සිවිල් හා දේශපාලන අයිතීන් නැත.

B - පවුල් ඒකකය තුළ කාන්තාවන්ට අයිතීන් ඇත.

C - ආර්ථික කටයුතු හා එහි ප්‍රතිලාභවලට කාන්තාවන්ට අයිතියක් නැත.

D - සමාජ වෙනස්කම්වලින් ආරක්ෂා වීමේ අයිතියක් නැත.

I. ABC  II. ABD  III. ACD  IV. BCD

34. ළමා අයිතිවාසිකම්

A – ප්‍රකාශනයේ නිදහස තිබිය යුතු ය.

B – සමාගමයේ අයිතිය නොතිබිය යුතු ය.

C – පෝෂණය ලැබීමේ අයිතිය අවශ්‍ය නැත.

D - ළමා ශ්‍රමය යොදා ගත හැකි ය.

I. ABC  II. ABD  III. ACD  IV. BCD

35. ළමා අයිතීන් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියා මාර්ග නම්,

A – එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය නොපිළිගැනීම.

B – ළමයින් සම්බන්ධ සෑම තීරණයක දී ම ළමයාගේ උපරිම යහපත සැලසෙන පරිදි කටයුතු කිරීම.

C – ජාතික ළමා ආරක්ෂණ අධිකාරියක් තවමත් පිහිටුවා නොතිබීම.

D - පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීමට යෝජනා කර තිබීම.

I. ABC  II. ABD  III. ACD  IV. BCD

36. කාර්මික සාමය ඇති කිරීම අරමුණු කර ගෙන ශ්‍රී ලංකාව සම්මත කර, ක්‍රියාත්මක කරන අණ පනත් නම්,

A – අධ්‍යාපනය ලබාදීමේ අණ පනත.

B – සේවක අර්ථසාධක අරමුදල් පනත.

C – වැඩිහිටි රැකවරණ ලබා දීමේ අණ පනත.

D - ළමයින් රැක ගැනීමේ ආඥා පනත.

I. ABC  II. ABD  III. ACD  IV. BCD

37. මූලික අයිතීන් කඩ වූ විට ගත හැකි ක්‍රියා මාර්ග නම්,

A – පාර්ලිමේන්තු ලේකම් වෙත පැමිණිලි කිරීම.

B - දිස්ත්‍රික් උසාවියකට ඉල්ලීමක් කළ හැකි ය.

C - මානව හිමිකම් කොමිසම වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි ය.

D - කෙළින්ම නීතිපතිවරයාට පැමිණිලි කළ හැකි ය.

I. ABC II. ABD III. ACD IV. BCD

38. පරිසරය පිළිබඳ මත හා නිර්වචන අතර

A – සුවඳැති මල් වර්ග අපේ සහෝදරයෝ වෙති.

B - මුවා, අශ්වයා, රාජාලියා අපේ සහෝදරයෝ නොවෙති.

C - සියැටල්ගේ ප්‍රකාශනය මෙයට අදළ නොවේ.

D - අශ්වයාගේ, මිනිසාගේ ගතේ උණුසුම මේ හැම දෙයක් ම අයත් වන්නේ එක ම පවුලක සාමාජිකයන්ට නොවේ.

I. ABC II. ABD III. ACD IV. BCD

39. ස්වාභාවික පරිසරයට අයත් ප්‍රපංච

A – ප්ලාස්ටික් ද්‍රව්‍යය

B – ඉටි කොළ ආශ්‍රිත නිෂ්පාදන

C – කෘත්‍රිම ආහාර ද්‍රව්‍යය

D - විවිධ ශාක වර්ග

I. ABC II. ABD III. ACD IV. BCD

40. ජල දූෂණය සිදු වන ක්‍රම

A – කර්මාන්ත මගින් ජලය දූෂිත නොවේ.

B – ස්වාභාවික හේතු මෙයට අදළ නොවේ.

C – කෘෂිකාර්මික කටයුතු මගින්.

D - කුණු කසළ හා මල මෙයට අදළ නොවේ.

I. ABC II. ABD III. ACD IV. BCD

The National e-learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි ]
முழுப் பதிப்புரிமையுடையது ]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | පුරවැසි අධ්‍යාපනය II පත්‍රය<br>குடியுரிமைக் கல்வி மற்றும் சமூக நிர்வாகம் வினாத்தாள்- 11<br>Citizenship Education Paper II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

සැලකිය යුතුයි

- පළමු වන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු වන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04ක් ඇතුළු ව ප්‍රශ්න 05කට පිළිතුරු ලියන්න.

1.

I. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ප්‍රධාන ස්වරූප දෙක ලියන්න. (ලකුණු 02)

II. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමට නොහැකි ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 02)

III. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් මාධ්‍ය මගින් ඉටු කළ යුතු කාර්යභාරයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

IV. රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප දෙක කුමක් ද ? (ලකුණු 02)

V. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තුළ සාමකාමී ජන සමාජයක් ගොඩනැගීමට හේතු වන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

VI. පළාත් සභාවක මහ ඇමති හා අමාත්‍ය මණ්ඩලය සතු බලතල හා කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

VII. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)

VIII. යහපාලනයක තිබිය යුතු මූලික ගුණාංග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

IX. නීතියේ මූලාශ්‍ර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

X. 1931 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයෙන් හඳුන්වා දුන් රාජ්‍ය නිලධාරීන් තිදෙනාගෙන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 2 x 10 = 20)

2.

I. ඈත අතීතයේ ඉන්දියාවේ 'වජ්ජි' පාලනය තුළ තිබූ සප්ත අපරිහානි ධර්ම වර්තමාන ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ද දක්නට ලැබේ. එම සප්ත අපරිහානි ධර්ම අතරින් දෙකක් දක්වන්න. (ලකුණු 02)

II. පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප තුන සඳහන් කරන්න. (ලකුණු 03)

III. නිදහස් හා සාධාරණ මැතිවරණයක පැවතිය යුතු ලක්ෂණ තුනක් දක්වා එයින් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

3.

I. ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ 02ක් දක්වන්න. (ලකුණු 02)

II. ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු අතරින් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

III. ආණ්ඩුව සමන්විත වන ආයතන තුන ලියා, ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

4.

I. නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට සිදුවී ඇති හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

II. සන්ධීය රාජ්‍යයක ලක්ෂණ 03ක් දක්වන්න. (ලකුණු 03)

III. ඒකීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණ තුනක් දක්වා ඒකීය ආණ්ඩු ක්‍රමය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 05)

5\.

I. ශ්‍රී ලංකාවේ ජීවත්වන සිංහල, දෙමළ ජන වර්ග හැර වෙනත් ජන වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

II. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක අතර සංක්‍රමණ ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාව තුළ සිදු වූ සංක්‍රමණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

III. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත් ව කටයුතු කිරීමෙන් සිදු වන වාසි තුනක් දක්වා, ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

6\.

I. මූලික ආර්ථික ප්‍රශ්න දෙකක් දක්වන්න. (ලකුණු 02)

II. ආර්ථිකයක විවිධ ක්‍රියාවලීන් සිදු වේ. එම ක්‍රියාවලීන් ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැකි ය. එම කොටස් තුන මොනවා ද ? (ලකුණු 03)

III. ලෝකයේ මේ වන විට විවිධ අර්ථ ක්‍රම ක්‍රියාත්මක වේ. එම අර්ථ ක්‍රම කොටස් 03කට බෙදේ. ඒ තුන සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

7\.

I. නීතියේ ගුණාංග අතරින් දෙකක් උපුටා ලියන්න. (ලකුණු 02)

II. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය වන රෝම ලන්දේසි නීතියට අමතර ව වෙනත් විශේෂ නීති වර්ග තුනක් ද ඇත. එම වර්ග 03 සඳහන් කරන්න. (ලකුණු 03)

III. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධිකරණ පද්ධතියෙන් තුනක් සඳහන් කර ඉන් එකක කාර්යයන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

The National e-learning Portal for The General Education

[සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
[All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | පුරවැසි අධ්‍යාපනය II පත්‍රය<br>குடியுரிமைக் கல்வி மற்றும் சமூக நிர்வாகம் வினாத்தாள்- 11<br>Citizenship Education Paper II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

මුස්ලිම් පාසල් සඳහා උපදෙස්

- දෙවන කොටසේ ප්‍රශ්න තෝරා ගැනීමේ දී ප්‍රශ්න අංක 8 හා 9 ප්‍රශ්න ද පිළිතුරු ලිවීමට තෝරා ගන්න. ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු ලියන්න.

8.

I. අන්තර්ජාතික නීතියේ පවතින ශාඛා දෙකක් නම් කරන්න. (ලකුණු 02)

II. මානව හිමිකම් කොමිසමේ ප්‍රධාන කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

III. අප්‍රමාද ව හා අපක්ෂපාතී ව යුක්තිය පසිඳලීම සිදු නොවීම නිසා සිදුවිය හැකි අවාසි තුනක් ලියන්න. ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

9.

I. 1947 සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ද්විමණ්ඩල පාර්ලිමේන්තුවේ මණ්ඩල 02 නම් කරන්න. (ලකුණු 02)

II. ලංකාවේ නැගෙනහිර පළාතට අයත් දිස්ත්‍රික්ක තුන සඳහන් කරන්න. (ලකුණු 03)

III. ඔබ පාසල අයත් වන පළාත් සභාව නම් කර පළාත් සභාව සහ පළාත් පාලන ආයතන මගින් ඔබ පළාතට ඉටු වන කාර්යයන් දෙකක් ලියන්න. ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)